**මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය**

**නාගරික සංවර්ධන අධිකාරිය**

# ටෙන්ඩර් දැන්වීමයි

## කොළඹ 12, කොච්චිකඩේ, ඩයස් පෙදෙසේ, පිඹුරු අංක 1992 හි ලොට් අංක ඒ හි සඳහන් ඉඩම සංවර්ධන කාර්යයක් සඳහා බදු දීම සඳහා ටෙන්ඩරය.

01. ආදයම් ටෙන්ඩර් මණ්ඩලයෙහි (ප්‍රධාන) සභාපති විසින්, කොළඹ 12, කොච්චිකඩේ, ඩයස් පෙදෙසෙහි පිහිටි ඉඩම, වාණිජ හෝ කාර්යාල සංවර්ධන කාර්යේ සඳහා වසර 30 ක පදනමින් බදු දීම සඳහා, ටෙන්ඩර් කැඳවනු ලැබේ. ලංසුකරුවන් විසින්, පහත වගුවේ සඳහන් මූලික මිල ප්‍රමාණය මත හෝ ඉන් ඉහළ මිලකට තමන්ගේ මිල ගණන් ඉදිරිපත් කළ යුතුය.

| ලොට් අංකය | පිඹුරේ අංකය | වපසරිය | මූලික වටිනාකම රුපියල් | නිර්දේශිත භාවිත කටයුතු | ලංසු බැඳුම්කරය රුපියල් |
|---|---|---|---|---|---|
| A | 1992 | අක්කර 0 - රූඩ් 0 - පර්චස් 26.91 | 99,000,000/- | වාණිජ හෝ කාර්යාල සංවර්ධන සඳහා | 1,500,000/- |

02. ආපසු ගෙවනු නොලබන ටෙන්ඩර් ගාස්තු රුපියල් 20,000/- ක් ජාගොබ හා වැට් බදු සමග මුදලින් ගෙවීමෙන්, 2017 සැප්තැම්බර් 11 වන දින සිට 2017 ඔක්තෝබර් 11 වන දින දක්වා පෙරවරු 9.00 හා පස්වරු 3.00 අතර කාලය තුළ, බත්තරමුල්ල, "සෙත්සිරිපාය" 06 වන මහල නාගරික සංවර්ධන අධිකාරියෙහි, ඉඩම් සංවර්ධන හා කළමණාකරණ අංශයේ අධ්‍යක්ෂක වෙතින් ලංසුලේඛන ලබා ගත හැක.

03. බත්තරමුල්ල, "සෙත්සිරිපාය" 06 වන මහලේ, ඉඩම් සංවර්ධන හා කළමණාකරණ අංශයේදී, ටෙන්ඩර් ලේඛන නිකුත් කරනු ලබන කාලය තුළ කාර්යාල වේලාවන් තුළදී, ටෙන්ඩර් ලේඛණ නොමිලයේ පරීක්ෂා කොට බැලිය හැක.

04. ටෙන්ඩර් සමග, රුපියල් 1,500,000/- වටිනා මුදලින් හෝ ඒක්ෂණ බැංකු ඇපකරයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක බැංකුවකින් ලබාගත්, නාගරික සංවර්ධන අධිකාරියේ නමට ගත්, ලංසු ඇපකරයක් තිබිය යුතුය. එම බැංකු ඇපකරය, ටෙන්ඩර් භාරගැනීම අවසන් කරනු ලබන දින සිට දින 180 ක් දක්වා (2018 අප්‍රේල් 17 වන දින දක්වා) වලංගු විය යුතුය.

05. ටෙන්ඩර් භාර ගැනීම 2017 ඔක්තෝබර් 12 වන දින පස්වරු 2.00 අවසන් කරනු ලබන අතර, ඒ හා සමගම බත්තරමුල්ල "සෙත්සිරිපාය" 06 වන මහලේ නාගරික සංවර්ධන අධිකාරියේ මූල්‍ය අංශයේදී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුහට හෝ ඔහුගේ / ඇයගේ බලය පැවරූ නියෝජිතයෙකු හට එම අවස්ථාවට පැමිණ සිටිය හැක.

06. යථා පරිදි සම්පූර්ණ කල ටෙන්ඩර් ලේඛන, ලියාපදිංචි තැපෑලෙන් සභාපති ආදයම් ටෙන්ඩර් මණ්ඩලය (ප්‍රධාන) මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ නාගරික සංවර්ධන අධිකාරිය, 06 වන මහල, "සෙත්සිරිපාය" ,බත්තරමුල්ල. යන ලිපිනයට එවීමෙන් හෝ බත්තරමුල්ල "සෙත්සිරිපාය" 06 වන මහලේ, නාගරික සංවර්ධන අධිකාරියේ මූල්‍ය අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමෙන් 2017.10.12 දින පස්වරු 2.00 ට පෙර ලැබීමට සැලැස්විය යුතුය. ටෙන්ඩරය බහාලූ මුද්‍රා තැබූ කවරයේ වම් ඉහළ කෙළවරේ "කොළඹ 12, ඩයස් පෙදෙසේ ඉඩම බදුදීම සඳහා ටෙන්ඩරය" යනුවෙන් සඳහන් කළ යුතුය.

07. කිසිදු හේතුවක් මත ප්‍රමාදවී ලැබෙන ටෙන්ඩර් භාරගනු නොලැබේ.

08. වැඩිදුර විස්තර, බත්තරමුල්ල, "සෙත්සිරිපාය" 06 වන මහලේ, නාගරික සංවර්ධන අධිකාරියේ ඉඩම් සංවර්ධන හා කළමණාකරණ අංශයේ අධ්‍යක්ෂ වෙතින් ලබාගත හැක.

දුරකථන 0113357363 හෝ 0112875916-20 දිගුව - 209

**සභාපති,**
**ආදායම් ටෙන්ඩර් මණ්ඩල (ප්‍රධාන),**
**මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය,**
**නාගරික සංවර්ධන අධිකාරිය,**
**06 වන මහල, "සෙත්සිරිපාය", බත්තරමුල්ල.**